2025 FEBRUARY

# Current Issues

ADIC
Alcohol and Drug Information Centre

# හැඳින්වීම

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC ආයතනය) වසර 30 කට වැඩි කාලයක් දුම්වැටි, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වලින් ජනතාව නිදහස් කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටියි. එම වැඩසටහන් අතර දුම්වැටි මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වීමට බලපාන සාධක නිරන්තරයෙන් සොයා බලා ඒ පිළිබඳව ජනතාව සහ අදාළ බලධාරින්ගේ අවධානයට යොමු කරමින් ඒවායේ බලය අඩු කිරීමටත් එම බලපෑම් නතර කිරීම සඳහාත් කටයුතු කරයි.

ඒ අනුව ආයතනයේ පුස්තකාල හා තොරතුරු අංශය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුවත්පත් වන සිළුමිණ, දිනමිණ, දිවයින, මව්බිම, ලංකාදීප, අද, අරුණ, මොණරා ආදී පුවත්පත් දිනපතා විශ්ලේෂණයක් සිදු කරයි. මීට අමතරව විද්‍යුත් මාධ්‍ය නාලිකා කිහිපයක්ද නිරීක්ෂණය කරයි. එහිදී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරයි.

- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අධෛර්යමත් කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් සිදුකිරීම

මෙම වාර්තාව තුළ ඉහත කරුණු පුවත්පත්වල වාර්තා වී ඇති ආකාරය කෙසේද යන්න සම්බන්ධව සඳහන් වී ඇත. මෙහි අරමුණ වන්නෙ පුවත්පත් තුළ දුම්වැටි, මද්‍යසාර සහ අනිකුත් මත්ද්‍රව්‍ය වලින් සිදුවන ප්‍රවර්ධනයන් අවම කිරීම සහ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව සිදුවන ධනාත්මක පළ කිරීම් පිළිබඳව ජනතාව සහ අදාළ බලධාරීන් දැනුවත් කිරීමයි.

# PRINT MEDIA

## PROMOTIONS












සිගරට් සහ මද්‍යසාර භාවිතා කරන දර්ශන ඇතුළත් චිත්‍රපටි ඔබට පවසන්නේ එහි අධ්‍යක්ෂකවරයා බොහෝ දුරට සිගරට් සහ මද්‍යසාර සමාගම් වල කොන්තරාත්තුවක් ඉටු කරන බවයි. එවැනි චිත්‍රපටි වල දර්ශන පුවත්පත් වල පළ කිරීමෙන් ඔවුන්ද එහි කොටස්කරුවන් බවට පත් වේ.

පුවත්පත් තුළින් ඇතැම් කතා පුවත් පළ කිරීමේදී යොදා ගන්නා වාක්‍ය රටාවන් මඟින් මද්‍යසාර ප්‍රචාරණය වීම හා පාඨකයා තුළ වැරදි සමාජ අවබෝධයන් ඇති විය හැක.



# සාදයේ සල්ලි ඉල්ලුවාම ඩෝප් හිඳිලා

■ මීරිගම විශේෂ පුෂ්පකුමාර මල්ලව ආරච්චි

**සුහද හමුවක පැවති මධුවිත සාදය සඳහා රුපියල් දෙදහසක කොටස් මුදලක් ඉල්ලීමේ සිද්ධියක් පසුගියදා බස්නාහිර පළාතේ පිටිසර ගම්මානයකින් වාර්තාවෙයි.**

සුහද හමුවට සහභාගි වූ ඇතැමකුට ඊ. බෝවීමට පෙරාතුව නිවසට යාමට සූදානම් වුවත් සංවිධායකයන්ගෙන් ඊට ඉඩ ලැබුණේ නැත. තමන් හා එක්ව සතුටුවී රාත්‍රී ආහාරයද ගෙන යන ලෙස ඉල්ලීමක් ඉදිරිපත්විය.

ඉල්ලීම ප්‍රතික්ෂේප කළ නොහැකිවූ නිසාද මෙහි කතා නායකයාද ඊට එක්වූයේය. මධු විතෙන් සප්පායම් වෙමින් හමුව උච්චතම අවස්ථාවට ...



# සූර්පිට මිනියත් එක්ක එළිවෙනකම් බුදියගෙන

■ කරන්දෙණිය - එම්. සුසිල් ප්‍රියන්ත

**මල් ශාලාවේ තැන්පත් කර තිබූ මෘත දේහයට ගරු බුහුමන් දැක්වීමට ගිය අයකුට ජීවිතයේ කවදාවත්ම මුහුණදීමට සිදු නොවූ කතාවක් දකුණු පළාතේ නගරයකින් අසන්නට ලැබේ.**



මද්‍යසාර සමාගම් විවිධ ආකාරයෙන් කාන්තාවන් රැවටීමට ලක් කරයි. ඇතැම් පුවත්පත් වල කාන්තාවන් මද්‍යසාර භාවිතා කරන රූප පළ කිරීම මඟින් කාන්තාවන් තුළ මද්‍යසාර භාවිතය උසස් යැයි වැරදි සම්මතයක් ඇති කරවමින් ඊට යොමු කරවීමට පුවත්පත් සමාගම් වලට උදව් කරයි.



# PRINT MEDIA

## PREVENTION

### ADIC reveals economic and health cost of liquor and tobacco use

FT Daily 2025.01.2?

INCURRING a staggering amount of annual economic loss of Rs. 241 billion, which is 1.5% of the country's Gross Domestic Product (GDP), Sri Lankans spend Rs. 1,210 million on arrack, beer and cigarettes daily, according to a survey conducted by the Alcohol and Drugs Information Centre (ADIC).

The statistics revealed that people between the age of 15 years and above 40 years spend Rs. 510 million on arrack, Rs. 180 million on beer, and Rs. 520 million on cigarettes per day.

According to the ADIC, income that generated from alcohol use in 2022 was Rs. 165.2 billion but the health and economic cost for that year for the alcohol use was Rs. 237 billion.

This includes direct healthcare costs and indirect costs such as absenteeism, presenteeism, and decreased labour force productivity.

When considering the districts included in the survey, the highest percentage of alcohol users was reported from Colombo (35.8%) while the second highest percentage was observed in Kandy (33.5%). The lowest number of alcohol users was reported in Jaffna (21.4%), the survey revealed.

The survey has also found that beer is the most popular type of alcohol product, which accounted for 53.8%, and second popular beverage is arrack that was 42%.

According to the survey, 35.6% people initiated alcohol use during big matches, parties, and other large gatherings and 32.8% due to peer influences for onset alcohol use.

While consumption of these beverages is an underlying cause and contributing factor to a number of diseases and injuries, leading to three million deaths globally each year, Sri Lanka has a significant burden of alcohol-related harm, with alcohol consumption responsible for 4,201 deaths per 100,000 people each year from non-communicable diseases and injuries, including liver cirrhosis, which accounts for 2,880 deaths per 100,000, road traffic accidents that reported 675 cases per 100,000 and cancers account for 646 cases per 100,000.

According to ADIC, 40 to 50 people die every day and 15,000-20,000 deaths are reported annually in Sri Lanka due to alcohol consumption. The ADIC report, which highlighted an urgent need for a multi-sectoral approach to reduce the health and social burden of alcohol, revealed that due to alcohol use the labour force has decreased by 57%.

More Page 2

### නොකළ යුතු වෙළෙඳාමෙන් යැපෙන බෞද්ධ රාජ්‍යය

### අයවැයෙන් දුම්වැටි හා මද්‍යසාර සඳහා විද්‍යාත්මක බදු වැඩිකිරීමක් ඕනෑ

- මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය

නව රජයේ මංගල අයවැයෙන් මද්‍යසාර සහ සිගරට් සඳහා විද්‍යාත්මක පදනමක් මත සුරාබදු වැඩි කිරීමක් සිදුකළහොත් රටට වාසිදායක බවක් අත්වේ.

සුරාබදු ආදායම ඉහළ නැංවීම තුළින් දුම්කොළ සහ මද්‍යසාර භාවිතා කරන පිරිස අඩු වන බව පැහැදිලි වේ.

### මොනරා

### මත්පැන් සිගරට් දවසක බිල්ල කෝටි 121ක්

ADIC හෙළි කරයි

# ඔබ තාමත් මත්වතුර දුම්පානයේ ගොදුරක් ද?



2025.02.02

● සුරේකා හිල්මිණි ඉලංකෝන්

ඉකුත් ජනවාරි 13 වැනිදා ඇමෙරිකා එක්සත් ජනපද ෆෙඩරල් රජයේ මහජන සෞඛ්‍ය සේවා ප්‍රධානි වෛද්‍ය විවේක් මූර්ති ඇමෙරිකානුවන් වෙත නිකුත් කළ නිල ප්‍රකාශයක් එරට සියලු ප්‍රජාවන්ගේ සෞඛ්‍ය පුරුදුවල හැරවුම් ලක්ෂයක් සටහන් කිරීමට සමත් විය.

**ඉඳහිට ගත්තත් නිතර ගත්තත් අවදානම එහෙමමයි**

මද්‍යසාර භාවිතය නිසා එක්සත් ජනපදයේ වාර්ෂිකව වාර්තා වූ පිළිකා රෝගීන් 00,000න් මරණ 20,000ක් සිදු වී ඇති බව මේ ප්‍රකාශය මගින් හෙළිදරව් කර ඇත. ඇමෙරිකානුවන්ගෙන් 70%ක් පමණ මද්‍යසාර පරිභෝජනය කරන අතර, මද්‍යසාර ඉඳහිට පානය කිරීම තම සෞඛ්‍යයට හොඳද නරකද යන්න පිළිබඳව පවා ඉන් බොහෝ දෙනකුට නිසි අවබෝධයක් නැති බවද මේ වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වේ.

මද්‍යසාර මගින් සිදු වන සෞඛ්‍යමය බලපෑම් පිළිබඳ පර්යේෂණ කරන දකුණු කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ අස්මා විශේෂඥ බ්‍රයන් ලී පවසන්නේ මද්‍යසාර හේතුවෙන් සිදු වන පිළිකා අවම වශයෙන් වර්ග හතක් ඇති බවත්, සුමන ආකාරයේ මද්‍යසාර ස්වල්පයක් භාවිත කිරීමෙන් පවා පිළිකා ඇතිවීමේ අවදානමක් ඇති බවත්, මද්‍යසාර පරිභෝජනය වැඩි වීමෙන් එම අවදානම තවත් වැඩි වන බවත්ය.



මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ සම්පත් ද සේරම්

**● මද්‍යසාර භාවිතය සහ පිළිකා වැලඳීමේ අවදානම**

බ්‍රයන් ලී ප්‍රමුඛ විශේෂඥ පර්යේෂක පිරිස වැඩිදුරටත් පවසා ඇත්තේ මද්‍යසාර, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේම පිළිකා අවදානම වැඩි කළද පිරිමින්ට වඩා කාන්තාවන්ට ඒ අවදානම වැඩි බවයි. වයස අවුරුදු 80ක කාන්තාවක් දිනකට එක් මද්‍යසාර වීදුරුවකට වඩා අඩුවෙන් පානය කළද ඇයගේ ජීවිත කාලය පුරා මද්‍යසාර ආශ්‍රිත පිළිකා වැලඳීමේ සම්භාවිතාව දළ වශයෙන් 17%ක් බවද එම වාර්තාවේ සඳහන් වේ. දිනකට එක් මද්‍යසාර වීදුරු දෙකක් භාවිත කරන පිරිමි අයකුට එම අවදානම 13%කි.

"එබැවින් ඔබ සෞඛ්‍ය සම්පන්නව ජීවත් වන්නේ නම්, කිසිදු මද්‍යසාර වර්ගයක් භාවිත නොකළ යුතුය. මන්ද යත්: ඒ සියල්ල විෂ සහිතය." ඒ, එම විශේෂඥයන්ගේ අදහසයි.

ඇමෙරිකාවේ තත්ත්වය එසේ වන්දී, මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වයද සෞඛ්‍යයට හිතකර නොවන බව මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) පවසයි. ඒ මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ සම්පත් ද සේරම් පැවසුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ සිදු වන වළක්වාගත හැකි මරණවලින් 10න් 8කටම බෝ නොවන රෝග හේතු වන බවත්, ඒ රෝග ඇති වීමට බලපාන ප්‍රධාන සාධක හතරෙන් දෙකක්ම දුම්වැටි සහ මද්‍යසාර භාවිතය බවත්ය. මෙරට බෝ නොවන රෝගවලින් සිදු වන මරණ ප්‍රමාණය මේ වන විට 80% දක්වා වැඩි වී තිබෙන අතර, මද්‍යසාර භාවිතය නිසා ශ්‍රී ලංකාවේ 15,000කට ආසන්න ප්‍රමාණයක් සහ දුම්වැටි භාවිතය නිසා 20,000කට ආසන්න ප්‍රමාණයක් වාර්ෂිකව මරණයට පත් වන බවද හෙතෙම සඳහන් කළේය. තවත් විශාල ප්‍රමාණයක් රෝගීන් බවට පත් කරන මද්‍යසාර සහ දුම්වැටි පුද්ගලයන්ගේ සතුට සහ නිදහස සීමා කරන ප්‍රධාන සාධකය බවට පත් වද්දී, දුම්කොළ සහ මද්‍යසාර සමාගම් වාර්ෂිකව තමන්ට අහිමි වන පාරිභෝගිකයන් වෙනුවට අපේ රටේ දරුවන් මද්‍යසාර සහ දුම්වැටිවලට යොමු කරගැනීමට විවිධ උපක්‍රම ක්‍රියාත්මක කරමින් සිටීම විශාල ඛේදවාචකයක් බව මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය නිරන්තරයෙන් අවධාරණය කරන කරුණකි.

මද්‍යසාර හා දුම්වැටි යනු සාමාන්‍ය පාරිභෝගික භාණ්ඩ නොවන අතර, ඒවායේ මිල සෑම විටම එම භාණ්ඩ මිල දී ගැනීම අඩාළ කරන මට්ටමක පවත්වා ගෙන යා යුතු වේ. එක්සත් ජනපද ෆෙඩරල් රජයේ මහජන සෞඛ්‍ය සේවා ප්‍රධානියා විසින් මද්‍යසාර බෝතල්වල මද්‍යසාර පිළිකා කාරකයක් බව සඳහන් කළ යුතු බව ඇමෙරිකානු රජයට නිර්දේශ කරනු ලැබුවේද ඒ අවදානම හොඳින් හැඳින ඇති නිසාය.

මද්‍යසාර සහ දුම්වැටි භාවිතයෙන් ඇති වන හානිය අවම කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් යෝජනා කරන ඵලදායි ප්‍රතිපත්ති අතර Increasing excise taxes ප්‍රමුඛ වේ. ඒ අනුව 2025 ජනවාරි මාසයේ සිදු වූ සුරා බදු වැඩි වීමද රටට වාසිදායක තත්ත්වයකි. එසේ වුවද 'සුරා බදු රටක සංවර්ධනය සඳහා යොදාගත හැකිය' යන අදහස යල්පැන ගිය අදහසක් බව මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය පවසයි. මද්‍යසාරවලින් ලැබෙන බදු ප්‍රමාණය, අවම වශයෙන් මද්‍යසාර නිසා සිදු වන ආර්ථික සහ සෞඛ්‍ය පිරිවැය පියවාගැනීමට සමත් වී නැති බව සංඛ්‍යා ලේඛනවලින් පැහැදිලි වේ. 2022 වසරේ UNDP ආයතනය සිදු කළ අධ්‍යයනයකට අනුව මද්‍යසාර නිසා සිදු වූ ආර්ථික සහ සෞඛ්‍ය පිරිවැය රුපියල් බිලියන 237කි. ඒ වසරේ මද්‍යසාර බදු ආදායම රුපියල් බිලියන 165.2කි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ මද්‍යසාර පාලනය සඳහා පවතින නිර්දේශවල සඳහන් වන්නේද ප්‍රමාණාත්මක ලෙස මද්‍යසාර බදු ඉහළ දැමීම රජයට අඩු වියදමින් කළ හැකි ඉතා ඵලදායි මද්‍යසාර පාලන ක්‍රියාමාර්ගයක් බවයි. ඒ බව අපේ රටේ මෑතක සිදු වූ සුරාබදු ඉහළ දැමීමෙන්ද පෙනී ගොස් ඇත.

**දුම්පානයෙන් නිදහස් වන්නේ කොහොමද?**

1. නැවැත්වීම සඳහා දිනයක් යොදාගන්න.
(ඒ සඳහා ඔබේ ජීවිතයේ විශේෂිත දිනයක් යොදාගැනීමෙන් ස්ථිර අධිෂ්ඨානයක්, ඉලක්කයක් ඇතිකර ගැනීම පහසු වේ)
2. ඔබේ තීරණය ගැන අන් අය සමඟ කතා බහ කරන්න.
(ඔබ සිගරැට් බීම නවත්වන්න යන බව ඔබේ සමීපතමයන්ට (බිරියට, පෙම්වතියට, දරුවන්ට සහ මිතුරන්ට) පවසන්න. එවිට ඔබට දුම් පානය නතර කිරීමට ඔවුන්ගේද උදවු ගත හැකිය.
3. ඉදිරියේදී ඇති විය හැකි ගැටලු ගැන සිතන්න.
(ඔබ සිගරැට් බීම නැවැත්වීමට යන විට තවමත් සිගරැට් බොන අයගෙන් සිදු විය හැකි බලපෑම් ගැන සිතන්න. විශේෂයෙන් උත්සව අවස්ථාවල හැසිරෙන ආකාරය සැලසුම් කරන්න. එහිදී කළ හැකි දේවල් ගැන මිතුරන් සමඟ කතා කරන්න. උපදෙස් ගන්න. ඔවුන්ගේ සහයෝගය ගන්න.)
4. ඔබේ තීරණය දුර්වල කරන, සිගරැට් බීමට බල කරන කණ්ඩායමට මුහුණ දීමට සූදානම් වෙන්න.
(මම සිගරැට් බොන එක නැවැත්තුවා, මට බල කරන්න එපා කියලා කියන්න පුරුදු වන්න)
5. නැවත නැවතත් සිගරැට් බීමට ඔබ තුළ ඇති කරන දැඩි ආශාව ගැනත් සිතන්න.
(ඔබට නවත්වාගෙන සිටීමේ අපහසුවක් ඇතිවී සිගරැට් එකක් බීමට සිදු වුණොත් ඒ ගැන පසුතැවෙන්න එපා. ඊළඟ අවස්ථාවේ සිට නැවතත් සිගරැට් භාවිතය නවත්වන්න)
6. සෑම විටම සිගරැට්වලින් නිදහස් වීමේ සතුට අත්විඳින්න. ඒ ගැන කතා කරන්න.

**● 2022 දී මද්‍යසාර නිසා සිදු වූ ආර්ථික සහ සෞඛ්‍ය පිරිවැය රුපියල් බිලියන 237ක්**

එහෙත් මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය වැඩිදුරටත් පවසන්නේ සුරා බදු වැඩි කිරීම මඟින් මද්‍යසාර මිල වැඩි වන සෑම අවස්ථාවකදීම මද්‍යසාර සමාගම් විසින් නීති විරෝධී මද්‍යසාර වැඩි වන බවට මතයක් ගොඩනැගීමට උත්සාහ දරන බව නිරීක්ෂණය වී ඇති බවය. කෙසේ වෙතත් නීත්‍යනුකූල හෝ නීත්‍යනුකූල නොවන හෝ මද්‍යසාරවලින් සිදු වන හානිය එකිනෙකට වෙනස් නොවන අතර, මේ සියලු මද්‍යසාර වර්ග සෞඛ්‍යයට දැඩි බලපෑමක් ඇති කරයි.

එබැවින් රජය නීත්‍යනුකූල නොවන මද්‍යසාර පාලනයට, කාර්යක්ෂම ලෙස නීතිය ක්‍රියාත්මක කරමින් නීති විරෝධී මද්‍යසාර පාලනය කිරීම සහ නීත්‍යනුකූල මද්‍යසාර භාවිතය අවම කිරීම සඳහා සුරා බදු වැඩි කිරීමත්, මද්‍යසාර ලබා ගැනීමේ ඇති පහසුව අවම කිරීමටත්, දරුවන් සහ තරුණයන් මද්‍යසාර භාවිතයට යොමු කරන උපක්‍රම වැළැක්වීමට කටයුතු කිරීමත් සඳහා විධිමත් වැඩපිළිවෙළක් සැකසීමත් සුරාබදු වැඩි කිරීමේදී එය විද්‍යාත්මක බදු ක්‍රමවේදයක් මඟින් සිදු විය යුතු බවත් මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය අවධාරණය කරයි.

**● දුම්පානයට ළමයින් සහ තරුණයන් හසු කර ගැනීමේ උපක්‍රම**

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ සම්පත් ද සේරම් විශේෂයෙන් අවධාරණය කරන්නේ දුම් පානය හේතුවෙන් දිනකට මෙරට 50-55 අතර ප්‍රමාණයක් අකාලයේ මිය යද්දී එසේ මිය යන පාරිභෝගිකයන් වෙනුවට නව පිරිසක් දුම් පානයට හුරු කරගැනීම සඳහා ළමයින් සහ තරුණයන් ඉලක්ක කරගත් ප්‍රචාරක උපක්‍රම දුම්කොළ සමාගම් විසින් කුට ආකාරයෙන් සිදු කරන බවයි. 2006 අංක 26 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත මගින් සිගරැට් ප්‍රචාරණය තහනම් කර තිබුණද දුම්පානයට ළමයින් සහ තරුණයන් හුරු කරගැනීමේ උපක්‍රම පිළිබඳ ජනතාව දැනුම්වත් වී සිටීම අත්‍යවශ්‍ය බවද මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය පවසයි. ළමයින් ගැවසෙන ස්ථාන අවට වෙළෙඳසල්වල දුම්වැටි බහුල කිරීම, ළමයින්ගේ ඇස් මට්ටමෙන් ගැටෙන තැන්වල දුම්වැටි අසුරා තැබීම, ක්‍රීඩා තරග, සංගීත සන්දර්ශන, විනෝද ප්‍රසංග තුළ දුම්වැටි ප්‍රවර්ධනය කිරීම, සිගරැට් නොවන දෑ ඒවා ප්‍රචාරණයට යොදාගැනීම, නව නිෂ්පාදන හඳුන්වා දීම, කාටූන්, ටෙලි නාට්‍ය, චිත්‍රපට ආදී ළමයින් අතර ජනප්‍රිය වැඩසටහන්වලට සිගරැට් ප්‍රචාරණ දෙබස් ඇතුළත් කිරීම ආදී උපක්‍රම ඒ අතර වේ.

මේ කුට උපක්‍රමවලින් දරුවන් බේරාගැනීම සඳහා දුම්කොළ සමාගම් ප්‍රචාරණ මඟින් සිදු කරන බොරු මවාපෑම් ගැන ඇත්ත සොයාගැනීමට දරුවන් උනන්දු කළ යුතුය. උදාහරණයක් ලෙස කඩවසම් නළුවන් දුම් පානය කරන බව මාධ්‍ය මඟින් පෙන්වුවද සැබෑ ලෝකයේ සිගරැට් බොන පුද්ගලයන් ඒ නිසාම අවලස්සන වන බව දරුවන්ට පැහැදිලි කර දිය යුතුය. දුම්කොළ සමාගම්වලට උදවු කරන රංගන ශිල්පීන්, දේශපාලනඥයන් ආදී ප්‍රසිද්ධ පුද්ගලයන් හඳුනාගෙන ඔවුන් හෙළි කිරීමත්, ඒ පිළිබඳ අප්‍රසාදය පළ කිරීමත් මඟින් ඔවුන් අපකීර්තියට පත් කළ හැකිය. දුම්කොළ සමාගම් ළමුන්ට සිගරැට් පෙවීමට උදවු කරන අවස්ථා පිළිබඳ අදාළ ආයතන සහ පොලීසිය දැනුම්වත් කර ඒවා නොපැවැත්වීමට කටයුතු කිරීමද කළ හැකිය.

මීට අමතරව මද්‍යසාර සහ දුම්කොළ සමාගම් ඒවා භාවිතය සඳහා කාන්තාවන් යොමු කර ගැනීමටද විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එහෙත් මෙරට කාන්තාවන් අතර ඒ පිළිබඳ නැඹුරුව අඩු වීම යහපත් තත්ත්වයකි. ශ්‍රී ලංකා සමාජයේ පැවැත්ම තවමත් රඳා පවතින්නේ පවුල කේන්ද්‍ර කරගෙන බැවින් බිරියක, මවක සහ සහෝදරියක ලෙස භූමිකා රැසක් නිරූපණය කරන කාන්තාවට මද්‍යසාරවලින් සහ දුම්කොළ භාවිතයෙන් සිය පවුලේ සාමාජිකයන් රැකගැනීම සඳහා දැඩි වගකීමක් පවතින බවද අමතක කළ යුතු නොවේ.

# කාන්තාවන් දුම්පානයට හුරුවීම වැඩිවී ඇතැයි කීම අසත්‍යයක්

ලංකාදීප 2025.01.16

ඌ ඉන්දික හේවාවිතාරණ

කාන්තාවන් වැඩි වශයෙන් දුම්පානයට හුරු වී තිබෙන බවට විවිධ ප්‍රකාශ සිදුවුවත් එවැනි තත්වයක් වාර්තා නොවන බව මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය සඳහන් කරයි.

සමස්ත ජනගහනයෙන් සියයට නවයක් වැනි ප්‍රමාණයක් දුම්පානය කරන බවද එම පිරිස් සැලකීමෙහිදී දුම්පානය කරන කාන්තාවන්ගේ ප්‍රතිශතය සියයට එකකට අඩු බවද එම සංගමයේ විධායක අධ්‍යක්ෂ සම්පත් ද සේරම් සඳහන් කළේය.

පොදුවේ සැලකීමේදී දුම්පානය කරන පිරිමින්ගේ ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩු වී යන නිසා කාන්තාවන් අතර දුම්පානය ප්‍රචලිත කිරීම සඳහා විවිධ උපක්‍රම සිදුවන බවද ඔහු පැවසීය.

ඇතැම් සමාගම් කාන්තාවන් වැඩිපුර ගැවසෙන ස්ථානවල මුදල් වියදම් කර කාන්තාවන් පිරිසක් යොදවා දුම්පානය කරවමින් කාන්තාවන් ඒ සඳහා යොමු කර ගැනීමට උත්සාහ කරන බවට වාර්තා වෙමින් තිබෙන බවත් හෙතෙම සඳහන් කළේය.

විවිධ නිර්මාණ සිදුකිරීමේදී කාන්තාවන් දුම්පානය කරන දර්ශන යොදගනිමින් තිබෙන බවද ඔහු කියා සිටියේය. මේ නිසා බලධාරීන් මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත් පොදුවේ සැලකීමේදී ගෙවීගිය වසර කිහිපයෙහිදී දුම්පානය කරන ප්‍රමාණය අඩුවෙමින් තිබෙන බවත් විධායක අධ්‍යක්ෂවරයා පැවසීය.

ජනගහනයෙන් සමස්ත දුම්පානය කරන ප්‍රමාණය සියයට පහක් දක්වා අඩු කර ගැනීමට හැකි වුවහොත් එය හොඳ තත්ත්වයක් බවද ඊට අදළ දැනුවත් කිරීම තම සංවිධානය විසින් සිදුකරන බවද ඔහු සඳහන් කළේය.

# මොනරා

## බෙබද්දෝ සහ දුම්බොන්නෝ

මොනතරම් ආර්ථික අපහසුතම තිබුණත් මෙරට ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් අරක්කු සහ සිගරට් සඳහා අත දිගහැර මුදල් වියදම් කිරීමට කිසිසේත්ම පැකිළෙන්නේ නැත. මේ තරක පුරුද්ද කොතරම් ද යත් මෙරට බෙබද්දන් සහ දුම්බොන්නන් ඒ සඳහා දිනකට රුපියල් කෝටි 121ක් වැය කරමින් ඇත. මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය විසින් නිකුත් කළ නිවේදනයක මේ බව සඳහන්ව ඇත. අප දන්නා පරිදි ජනගහනයේ අනුපාතයක් ලෙස අරක්කු සහ සිගරට් සඳහා දිනකට මෙතෙක් මුදලක් වැය කරන ජාතියක් ලොවෙන් නැත. මෙමගින් අපට අනුමාන කළ හැකි වන්නේ සිගරට් දුමට කළුවුණු පෙණහලු සහ අරක්කු විසට නරක් වූ අක්මා සහිත ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මෙරට ජනගහනයට අයත් වන බව ය. බහුතරයක් බොදුනුවන් වෙසෙන රටක, පස් පව්වලට අයත් මේ නරක පුරුද්ද දිනෙන් දින ඉහළ යාම වෙනත් අර්ථයකින් ගත් කල රටේ අවාසනාවක් ලෙස ද නම් කළ හැකි ය.

මෙරට සිදුවන මරණ ගත් කල 83%ක පිරිසක් මියයන්නේ බෝ නොවන රෝග හේතුවෙන් බව සෞඛ්‍ය අමාත්‍යංශය විසින් හඳුනාගෙන ඇත. මෙම බෝ නොවන රෝග රට පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමට බලපාන ලද ප්‍රධාන සාධක හතරක් හඳුනාගෙන ඇති අතර මද්‍යසාර හා දුම්පානය එම සාධක හතර අතර ප්‍රධාන තැනක් ගිමිකර ගෙන ඇත.

මෙය අද ඊයේ ඇති වූ තත්ත්වයක් නොව දිගින් දිගටම පැවත එන්නක් ය. වරක් මෙම තත්ත්වයේ වෙනසක් ඇති කිරීමේ අටියෙන් ගෝඨාභය රාජපක්ෂ පාලනය තුළ 'මතට තිත' නමින් වැඩසටහනක් ද ක්‍රියාත්මක විය. එයද ගෝඨාභය පාලන සමයට අත් වූ ඉරණමට සමාන ඉරණමකට ලක් වෙමින් විනාශයට පත් වූ ආකාරයක් දැක ගත හැකි විය.

අරක්කු සහ සිගරට් අලවියෙන් රජයට වාර්ෂිකව අය වන බදු මුදල් අරක්කු සහ සිගරට්වලින් සිදුවන හානිපූරණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් නො වන බව එම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සිදුකළ සමීක්ෂණ වාර්තාවලින් අනාවරණය වන තවත් කරුණක් ය. ඊට එක් හේතුවක් නම් මෙරට මහා පරිමාණ මද්‍යසාර නිෂ්පාදකයන් දිගින් දිගටම බදු පැහැර හැරීමේ සෙල්ලමක නිරත වීම ය. අක්මාව ලිහි ගිලිහී ගිය ද බෙබද්දා මදු බඳුන් අත් නොහරින්නේ ය. දුම් බොන්නා ද එසේම ය. පිළිකා කාරක කොතෙක් තිබුණත් දුම් වැටිය අත නොහරින්නේ ය.


සමාජ ආර්ථික ව්‍යසනයක් බවට පත්ව ඇති මෙම තත්ත්වයෙන් යම්තාක් දුරට හෝ රට මුදා ගැනීමට ඇති එකම විකල්පය නම් 'සුරා බදු' ඉහළ නැංවීම ය. එලෙස ඉහළ නංවන ලද සුරා බදු අය කරගැනීමේදී ඒ සඳහා විද්‍යාත්මක සහ වඩාත් ප්‍රායෝගික ක්‍රම සහ විධි අනුගමනය කළ යුතු ය. අප එසේ සඳහන් කරන්නේ පසුගිය වසර දෙක තුන ගත් කල රටේ බදු ආදායම ඉහළ ගියද සුරා බදු ආදායම ඊට ප්‍රතිවිරුද්ධව පහළ යෑමක් දකින්නට ලැබීම හේතුවෙන් ය. උණ පුරුකේ දැම්මත් බලු වලිගේ ඇද යවන්න නොහැකි බවට ජනවහරේ කියමනක් ඇත. බෙබද්දන් සහ දුම්බොන්නන් විෂයෙහිද එම කියමන ඇත්තක් ය. එබැවින් සුරා බදු වැඩිකර බදු බරින් පෙළෙන ජනතාවට එමගින් හෝ සහනයක් සැලසීම රටේ ආර්ථිකයට පමණක් නොව පවුලේ සමගිය, සමාජයේ යහ පැවැත්ම පිණිස ද ප්‍රධාන වශයෙන් හේතුවන බව අපගේ වැටහීම ය. හිඟන ආර්ථිකයක් සහිත රටක අරක්කු සහ සිගරට් සඳහා දිනකට රුපියල් කෝටි 121ක් වැය කිරීම අප තේරුම් ගත යුත්තේ බෙබද්දන්ට හා දුම්බොන්නන්ට බර කෝණයකින් නොව රටේ ආර්ථිකයට යම් හෝ සහනයක් එමගින් උදා කරගැනීමේ අර්ථයෙන් ය.

ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගේ දුම්වැටි සහ මද්‍යසාර භාවිතය අතිශයින් අඩු මට්ටමක පවතින අතර දුම්කොළ සහ මද්‍යසාර සමාගම් කාන්තාවන් ඔවුන්ගේ පාරිභෝගිකයන් බවට පත්කර ගැනීමට සහ කාන්තාවන් අතර දුම්කොළ සහ මද්‍යසාර වෙළඳාම සාමාන්‍යකරණය කිරීමට විවිධ උපායමාර්ග යෙදවීමට නිරන්තරයෙන් උත්සාහ කරයි.

# PRINT MEDIA

## LAW ENFORCEMENT

### ලක්ෂ 43ක රට සිගරට් කටුනායකට ගෙනා හිටපු කෘ.ප.නි. සහකාරවරියක් අත්අඩංගුවට



2025.02.27

| කටුනායක - ගයා තිරිමාදුර

රුපියල් හතළිස් තුන්ලක්ෂ විසිදහසක් වටිනා විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගයක්, නීති විරෝධී ලෙස මෙරටට රැගෙන විත්, කටුනායක ගුවන් තොටුපොළෙන් පිට කර ගෙන යමින් සිටි ශ්‍රී ලාංකික ගුවන් මගී කාන්තාවක, ඊයෙ (26දා) අලුයම පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් පිරිසක් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

ඇය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරියක ලෙස කලක් සේවය කළ, පොල්ගහවෙල ප්‍රදේශයේ පදිංචි 47 හැවිරිදි කාන්තාවකි.

ඇය ඊයේ අලුයම, ඩුබායි සිට ෆ්ලයි ඩුබායි ගුවන් සේවයේ 8 ඩී.-822 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන්තොටුපොළ වෙත පැමිණ තිබුණි.

ඇය විසින් රැගෙන ආ ගමන් මලු තුළ විදේශීය නිෂ්පාදිත ''ප්ලැටිනම්'' වර්ගයේ දුම්වැටි 28,800ක් අඩංගු දුම්වැටි කාටූන් 144ක් සඟවා ගෙන තිබියදී, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මේ වන විට මෙම කාන්තාව පොලිස් ඇප මත මුදා හැර ඇති අතර, එළඹෙන 05 දින ඇය මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

රට තුළ නීති ගත කර ඇති සිගරට් නිසා ඇති වී තිබෙන කරදරය දැන දැනත් තවත් සිගරට් රට තුළට ගේන්න ඉඩ නොදිය යුතුය.

සිගරට් මිල වැඩි වෙද්දි සිගරට් භාවිතය අඩු වේ. එය දුම්කොළ සමාගමට පාඩුවකි. නීති විරෝධී සිගරට් වැඩි වෙලා කියලා දැන්වීම් දාලා දුම්කොළ සමාගම උත්සාහ කරන්නේ සිගරට් මිල අඩු කරගන්න.

### ලක්ෂ 72ක රට සිගරැට් කටුනායකින් පන්නන්න ගිය දෙදෙනෙක් කොටු



2025.02.26

| කටුනායක - ගයා තිරිමාදුර

රුපියල් හැත්තෑ දෙලක්ෂයක් වටිනා විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගයක් නීති විරෝධී ලෙස මෙරටට රැගෙන විත්, කටුනායක ගුවන්තොටුපොළෙන් පිටකරගෙන යමින් සිටි ගුවන් මගීන් දෙදෙනකු ඊයේ (24 දින) අලුයම ගුවන්තොටුපොළ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් පිරිසක් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මොවුන් දෙදෙනාගෙන් එක් අයකු කෑගල්ල ප්‍රදේශයේ පදිංචි 22 හැවිරිදි වියේ පසුවන්නකු වන අතර අනෙක් පුද්ගලයා ගම්පහ, ගණේමුල්ල ප්‍රදේශයේ පදිංචි 24 හැවිරිදි අයෙකි. මොවුන් දෙදෙනාම මෙරට රියැදුරු වෘත්තියේ නියැළී සිටින්නන් වේ.

මොවුන් 24 දින අලුයම 2.45ට සාජා නුවර සිට ගල්ෆ් ගුවන් සේවයේ 8 ඩී.-9587 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන්තොටුපොළ වෙත පැමිණ තිබුණි.

ඔවුන් විසින් රැගෙන ආ ගමන් මලු 04 තුළ විදේශීය නිෂ්පාදිත 'ප්ලැටිනම්' වර්ගයේ දුම්වැටි 48,000ක් අඩංගු දුම්වැටි කාටූන් 240ක් සඟවාගෙන සිටියදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මොවුන් දෙදෙනා මේ වන විට පොලිස් ඇප මත මුදාහැර ඇති අතර, ඔවුන් එළැඹෙන 25 දින අත්අඩංගුවට ගත් දුම්වැටි තොගයත් සමග මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

### ලක්ෂ 150කට වැඩියෙන් වටිනා රට සිගරට් කටුනායකට ගෙනා 4ක් අත්අඩංගුවට

| කටුනායක - ගයා තිරිමාදුර



2025.02.19

රුපියල් එක්කෝටි පනස් එක්ලක්ෂ පනස් දහසක් වටිනා විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගයක් නීතිවිරෝධී ලෙස මෙරටට රැගෙන විත්, කටුනායක ගුවන් තොටුපොළෙන් පිට කර ගෙන යමින් සිටි ගුවන් මගීන් සිවුදෙනෙක් පෙරේදා 17 සහ ඊයේ 18 යන දෙදින පැය 12 ක කාලයක් තුළ සිදුකළ මෙහෙයුමකින් ගුවන් තොටුපොළ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් පිරිසක් විසින් අත්අඩංගුවට ගනු ලැබූහ.

ඔවුන් සියලුදෙනාම ඩුබායි සිට නීතිවිරෝධී ලෙස මෙම විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොග රැගෙන විත් තිබීම ද විශේෂත්වයකි.

ඒ අනුව ඊයේ (18 දින) අලුයම 01.20ට ඩුබායි සිට ෆ්ලයි ඩුබායි ගුවන් සේවයේ එෆ්.ඉසෙඩ්.-569 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණි පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචි 48 හැවිරිදි ගුවන් මගී කාන්තාවක් සහ රජ්නායකපුර ප්‍රදේශයේ පදිංචි 23 හැවිරිදි ගුවන් මගී තරුණයකු සිය ගමන් මලු තුළ සඟවාගෙන 'ප්ලැටිනම්' සහ 'මැන්චෙස්ටර්' වර්ගයේ විදේශීය නිෂ්පාදිත දුම්වැටි 68,000 ක් අඩංගු දුම්වැටි කාටූන් 340 ක් රැගෙන විත් තිබුණි. ඊට අමතරව පෙරේදා 17 දින පස්වරු 01.20ට සහ පස්වරු 05.10ට ඩුබායි සිට ෆ්ලයි ඩුබායි සහ ෆිට්ස් එයාර් ගුවන් සේවා යානාවලින් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණි 35 හැවිරිදි වැලිපැන්න ප්‍රදේශයේ පදිංචි ගුවන් මගියකු සහ 51 හැවිරිදි ඉන්දීය ජාතික ගුවන් මගියකු විසින් විදේශීය නිෂ්පාදිත 'බෙන්සන්', 'ප්ලැටිනම්' සහ 'මැන්චෙස්ටර්' වර්ගයේ දුම්වැටි 33,000ක් අඩංගු දුම්වැටි කාටූන් 165ක් සිය ගමන් මලු තුළ සඟවා ගෙන පැමිණ තිබුණි.

මෙම ගුවන් මගීන් සිවුදෙනා 17 වැනිදා පස්වරු 01.20 සිට 18 වැනිදා අලුයම 01.20 තෙක් පැය 12ක කාලය තුළ රුපියල් එක්කෝටි පනස්එක්ලක්ෂ පනස්දහසක් වටිනා, විදේශීය නිෂ්පාදිත දුම්වැටි 101,000ක් අඩංගු දුම්වැටි කාටූන් 505ක් නීතිවිරෝධී ලෙස මෙරටට රැගෙන විත් කටුනායක ගුවන් තොටුපොළෙන් පිට කර ගෙන යාමට තැත් කර තිබුණි.

මොවුන් සියලුදෙනාම මේ වන විට පොලිස් ඇප මත මුදා හැරීමට පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් පියවර ගෙන ඇති අතර ඔවුන් සමග නීතිවිරෝධී ලෙස මෙරටට රැගෙන ආ දුම්වැටි තොගය ද අද (19) මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

### දඹුල්ල සළුඅපුල්ලන වැවේ හොරට බීඩි හදද්දී කොටු

2025.02.11

| දඹුල්ල - චමින්ද නවරත්න

මෙරට ප්‍රධාන පෙළේ බීඩි සමාගමක සේවකයන් හට ලද තොරතුරකට අනුව දඹුල්ල සළුඅපුල්ලන වැව ප්‍රදේශයේ නිවසක් තුළ නීති විරෝධී අයුරින් සිදුකරමින් ගිය ව්‍යාජ බීඩි නිෂ්පාදනාගාරයක් වටලා එම ව්‍යාජ බීඩි නිෂ්පාදය සඳහා යොදාගන්නා ව්‍යාජ ඇසුරුම් සමග පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට පෙරේදා (09දා) දඹුල්ල පොලිසියේ විශේෂ පොලිස් කණ්ඩායමක් සමත්ව තිබේ.

ශ්‍රී ලංකාවේ නමගිය බීඩි නිෂ්පාදන සමාගමක වෙළෙඳ නාමය යොදාගනිමින් මෙම බීඩි නිෂ්පාදනාගාරය පවත්වාගෙන ගොස් ඇති බවත් එම ස්ථානය තුළ තිබූ බීඩි නිෂ්පාදනයට ලබාගන්නා ඇසුරුම් සමග නිෂ්පාදනය කළ බීඩි තොගයක් සමග සැකකරුවකු



■ ප්‍රසිද්ධ වෙළෙඳ නාමකට මුවා වී කළ වැඩක්

අත්අඩංගුවට ගත් බවත් දඹුල්ල පොලිසිය පැවසීය. දඹුල්ල මූලස්ථාන පොලිස් ස්ථානාධිපති වසන්ත කුමාර මහතාගේ උපදෙස් මත ක්‍රියාත්මක පොලිස් අපරාධ අංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ස්ථානාධිපති සාලිය ගන්දරවත්ත මහතා ප්‍රමුඛ පො.සැ. (7836) අධිකාරි, පො.සැ. (73728) සමන්, පො.කො. (57196) කුමාර, පො.කො. (59883) නිලන්ත යන නිලධාරීහු මෙම වැටලීම සිදුකළහ. සැකකරු සමග අත්අඩංගුවට ගත් නීති විරෝධී බීඩි තොගය හා ඇසුරුම් ඊයේ (10දා) දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු සැකකරු දින 24ක් දක්වා රිමාන්ඩ් කිරීමට නියම කෙරිණ.

**මෙවැනි නීති විරෝධී මද්‍යසාර පාලනයට ගත හැකි හොඳම පියවර නීතිය ක්‍රියාත්මක කිරීමයි.**



යුගයේ ජනහඬ

# ලයිසන් නැතිව ගෙදර රට අරක්කු විකිණූ

## ත්‍රිවිල් ගාමිණීට මාංචු

### බාර් වැසූ පෝය දවසේ ජයට විකුණලා

හොරණ - මානෙල් ගමගේ



# තුන්නානේ ගේක ජයටම කසිප්පු පෙරලා


■ පාදුක්ක විශේෂ නිහාල් වෙත්තසිංහ

**පාදුක්ක පොලිස් වසමේ තුන්නාන පැල්පොලමුල්ල ප්‍රදේශයේ නිවෙසක කාමරයක ඉතා රහසිගතව පවත්වාගෙන ගිය මහා පරිමාණයේ කසිප්පු පෙරීමේ ස්ථානයක් වටලා බැරල් 11 ගබඩා කර තිබූ ගෝඩා මිලි ලීටර් 16,20,000 ක්ද, පෙරීමේ උපකරණද සමග පුද්ගලයකු 23 වැනිදා අත්අඩංගුවට ගත් බව පාදුක්ක පොලිසිය පවසයි.**

පාදුක්ක පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත කළ මෙම වැටලීමේදී අත්අඩංගුවට ගත් තුන්නාන ප්‍රදේශයේ පදිංචි 31 හැවිරිදි සැකකරුගෙන් ප්‍රශ්න කිරීමේදී, ඉතා කෙටි කාලයකදී මහා පරිමාණයෙන් මෙලෙස කසිප්පු පෙරීම ආරම්භ කර ඇති බවත්, එලෙස නිෂ්පාදනය කරන කසිප්පු හෝමාගම, අතුරුගිරිය සහ මීගොඩ යන ප්‍රදේශවලට අලෙවි කිරීමට සැලසුම් කර තිබූ බවද සැකකරුගේ ප්‍රකාශවලින් හෙළි වූ බව පොලිසිය කියයි.

සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

පාදුක්ක පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කංචන මුණසිංහ මහතාගේ උපදෙස් මත දූෂණ මර්දන අංශය ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ප්‍රදීප් රණසිංහ, පොලිස් සැරයන් 52343 ධම්මික, පොලිස් කොස්තාපල්වරුන් වන 83275 දිසානායක, 94034 සම්පත්, 101094 ඉදුරංග, 100240 අබේරත්න යන නිලධාරීහු වැටලීම කළහ.



# පොල්පිතිගම පොලිසියේ විශේෂ මෙහෙයුමකින් කසිප්පු බෝතල් 50ක් එක්ක දෙදෙනෙක් කොටු

■ වෙනත් වැරැදි කළ 11 දෙනකුටත් මාංචු

පොල්පිතිගම - නන්දන කැලේගම

පොලිස් විශේෂ මෙහෙයුම් රාජකාරියේ යෙදී සිටියදී යතුරුපැදියක සඟවාගෙන රැගෙන ගිය කසිප්පු බෝතල් පනහක් සමග සැකකරුවන් දෙදෙනකු (09දා) රාත්‍රියේදී අත්අඩංගුවට ගත් බව පොල්පිතිගම රථ වාහන අංශය පවසයි.

නිකවැරටිය කොට්ඨාස භාර පොලිස් අධිකාරී වසන්ත ජයමිණි කුමාර මහතාගේ නියෝගයකට අනුව පොල්පිතිගම රථ වාහන අංශය හා දූෂණ මර්දන අංශය එක්ව මෙම මෙහෙයුම පෙරේදා (09 දා) සවස 5.00 සිට රාත්‍රි 9.00 දක්වා දියත් කළ බව පොලිසිය කියයි.

එහිදී ගල්වැංවැව ඉදිගොල්ල ප්‍රදේශයේ සිට ගාලවැව ජාවාරම්කරුවකුට අලෙවි කිරීමට පොලිතින් උරවල බහා ගෙනගිය මෙම කසිප්පු තොගය රථ වාහන අංශයේ පොලිස් සැරයන් (34076) එදිරිසිංහ හා පොලිස් සැරයන් (36468) රංජිත් යන දෙදෙනා විසින් රාත්‍රි 7.30ට පමණ අත්අඩංගුවට ගෙන තිබේ.

ඊට අමතරව තවදුරටත් දියත් කළ මෙහෙයුමේදී අයිස් මිලිග්‍රෑම් 4350ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනකු, බීමත් රියැදුරන් තිදෙනකු, වරෙන්තුකරුවකු සැකපිට එක් අයකු හා රථවාහන නඩුවලට සම්බන්ධ හතර දෙනකු අත්අඩංගුවට ගත් බව ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ.ඒ.පී.ඒ. කුලතුංග පැවසීය. සැකකරුවන් මහව මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. සිද්ධීන් සම්බන්ධව පොල්පිතිගම පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.



# වසර 13ක් හිරේ ගිහින් ඇවිත් යළි කසිප්පු පෙරලා කොටු

# DIGITAL MEDIA

## PROMOTIONS



Salena Nuwan (සැලෙනා නුවන්) | Episode 227 | 08th February 2025

දෙරණ නාලිකාවේ සති අන්තයේ විකාශය වන සැලෙනා නුවන් ටෙලි නාට්‍ය තුළ මධ්‍යසාර ප්‍රවර්ධනය කරන ආකාරය.



Recondition Kella || EPISODE 51 || රීකන්ඩිශන් කෙල්ල || 08th February 2025

ස්වර්ණවාහිනී නාලිකාවේ සති අන්තයේ විකාශය වන රීකන්ඩිශන් කෙල්ල ටෙලි නාට්‍ය තුළ මද්‍යසාර ප්‍රචාරණය කරමින් කාන්තාවන් ද මෙයට හසුකර ගැනීමට ගන්නා උත්සාහය.



Maayavi (මායාවී) | Episode 113 | 07th February 2025 | Sirasa TV

සිරස නාලිකාවේ සතියේ දින වල විකාශය වන මායාවී ටෙලි නාට්‍ය තුළ මද්‍යසාර භාවිතය ප්‍රවර්ධනය කරන ආකාරය.

**2006 අංක 27 දරණ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත මගින් දුම්කොළ සහ මද්‍යසාර ප්‍රචාරණය තහනම් කර තිබියදීත් රූපවාහිනී නාලිකාවල මද්‍යසාර ප්‍රචාරණය කරන ආකාරය සහ කාන්තාවන් මේ සඳහා පොළඹවා ගැනීමට දරන උත්සාහය**

# ජනමාධ්‍යක සමාජ මෙහෙවර නම්!